ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC අභිමාන විශ්‍රාම සැලසුම				
නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම**	**ප්‍රධාන නියම හා කොන්දේසි**
විශ්‍රාම සැලසුම	• විශ්‍රාම ප්‍රතිලාභය මාසිකව රු.10,000/- ගුණාකාරවලින් ලබාගතහැකිය. • එකවර ගෙවීමක් ලෙස හෝ මාසික වශයෙන් ගෙවීමේ හැකියාව • ඔබේ විශ්‍රාම සැලසුම ඔබ විසින්ම තෝරාගැනීමේ හැකියාව • මුදල් තැන්පත්කිරීම ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් සිදුකළ හැකිය.	• විශ්‍රාම සැලසුම් විකල්ප සඳහා https://www.boc.lk/personalbanking/investment-plans/investmentaccounts/abhimana-retirement-scheme වෙත පිවිසෙන්න. • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	• වයස අවු. 18ට වැඩි ශ්‍රී ලංකාවේ පුද්ගලයින්ට ගිණුම විවෘත කළ හැකිය. • තනි පුද්ගල ගිණුම් පමණක් විවෘත කළ හැකිය. බද්ධ ගිණුම්වලට අවසර නොලැබේ. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, BOC අභිමාන ඉතුරුම් ගිණුම් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	- කල්පිරීමේදී ගිණුම්හිමියන් විසින් ජීවිත සහතිකය අර්ධ වාර්ෂිකව බැංකුවට ඉදිරිපත් කළයුතුය. - මාසික වාරිකය අඛණ්ඩ මාස 12ක් ගෙවීමට අපොහොසත්වුවහොත්, විශ්‍රාම සැලසුම නතර වන අතර, එය සාමාන්‍ය ඉතුරුම් ගිණුමකට හරවනු ලැබේ. අදාළ පොලී අනුපාතය වනුයේ වාර්ෂිකව 4%ක් හෝ එකලට පවත්නා සාමාන්‍ය ඉතුරුම් ගිණුම් අනුපාතය යන දෙකෙන් අඩු අගය යි. o වාරික 12ක් නොගෙවුවහොත්, o විශ්‍රාම සැලසුමෙන් ස්වේච්ඡාවෙන් ඉවත් වුවහොත්, o දායකත්වය දරන කාලයේදී දායකයාගේ මරණය සිදුවුවහොත්, ගිණුම්හිමියා විශ්‍රාම සැලසුමේ සාමාජිකයකු වීම නතර වේ. - ගිණුම්හිමියාගේ මරණයදී, ඔහුගේ නාමිකයාට නිමැවුමේ කලින් දක්වා ඇති නියම හා කොන්දේසි මත ප්‍රතිලාභ හිමිවේ. - නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

Classification: Internal

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
-
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.

අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk
- තැපෑල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.